වෛද්‍ය විද්‍යාව

# ගංගා ජමුනා වෙන් කළ හැටි



දෙබිඩි දරුවන් මව හා පියා සමග සිංගප්පූරු මහරෝහලේ දී

සැත්කම සැලසුම් කර තිබුණේ පැය 36 කට ය. ඇත්තෙන් ම එය ඉතා දිගු කාලයකි. ඒත් කිසිවකුගේ නෙත් ඔරලෝසුව දෙස යොමුවී තිබුණේ නැත. සිංගප්පූරු මහ රෝහලේ 20 දෙනකුගෙන් යුත් ශල්‍ය වෛද්‍ය කණ්ඩායම මේ සැත්කම සඳහා මාස කීපයක් තිස්සේ සූදානම් වූහ. මේ අපූර්ව සැත්කම හිසෙන් එකට ඇලී සිටි දෙබිඩි දැරියන් දෙදෙනකු වෙන් කිරීම ය. මෙම සැත්කමේ හැම පියවරක් ම ඉතා අවදානම් එකක් විය. දෙබිඩි දරුවන්ගේ මොළ ඉතා ප්‍රවේශමෙන් දෙපැත්තට කපා වෙන් කිරීම ඔවුනට බාර වූ මේ බැරෑරුම් කටයුත්තයි. මෙහිදි ධමනි හා නාළිකා කපා වෙන් කරන්නත් ඇතැම් විට ඒවා මුද්‍රා තබන්නටත් සිදු විය.

වෛද්‍යවරුනට මින් පෙර මෙතරම් බැරෑරුම් කටයුත්තකට අත ගැසීමට සිදු නොවී ය. වෙහෙසකර සැත්කමෙන් පසුව වුව ද ඔවුන්ට විවේකයක් නොවී ය. 'විවේක ගන්න හැදුවත් සිතට නම් විවේකයක් තිබුණේ නෑ. හරියට නිදගන්නවත් බැරිවුණා." යි වෛද්‍ය කණ්ඩායමේ නායක ශල්‍ය වෛද්‍ය වුම්පත් වැන් කීවේ ය. ඔහු මේ සඳහා වෙහෙසුණු මුළු පැය ගණන 70 ක් විය. ඉන් පැය 27 ක් එක දිගට ම සැත්කමට සහභාගි විය. එහිදී ඔහු ලද පීඩනය අති විශාල විය. ' ඒක ඇත්තට ම ඉතාමත් හැඟීම් බර පැය කීපයක්. සමහර අවස්ථාවල මා වැලපුණා. එක රුධිර නාළිකාවක් කපන්නට පෙර මට මොහොතකට එය නවතා කණ්ඩායම සමග කතා කරන්න සිද්ධ වුණා. ඒ මොකද සමහර විට ඒ එක කැපුමකින් දෙදෙනාගෙන් කාට හරි ආබාධිත තත්ත්වයක් ඇති විය හැකියි' වැන් කිවේ ය.

වෛද්‍යවරුන් මෙසේ ශල්‍යාගාරය තුළ වෙහෙසෙද්දී දැරියන්ගේ පවුලේ උදවිය ඉන් පිටත කුමකින් කුමක් වේදෝසි ගැහෙමින් බලා සිටියහ. අවසානයේදී පැය 97 කට පසු ඒ සියල්ල නිමා විය. ගංගා හා ජමුනා දැරියන් දෙදෙනා උපත ලබා 11 මසකට පසු, වෙන වෙන ම වඩා ගත හැකි විය. වෙනම දැඩි සත්කාර කුටි දෙකක තැබිය හැකි විය.

සැත්කමින් දින කීපයකට පසු ජමුනා දඟකාර බවක් පළ කරන්නට විය. ඇය මීට මෙලවූ අතින් ඇඳට ගැසුවා ය. හෙදියන්ට පා පහර එල්ල කළා ය. ඇගේ සොයුරිය ඒ වන විටත් විශේෂ ශ්වසන කුටිය තුළ විශේෂ වෛද්‍ය නිරීක්ෂණ මත පසු වුණා ය.

දැනට සුවසේ පසුවුනත් මේ දරුවන් දෙදෙනා තවමත් අවදානම් තත්ත්වයෙන් මිදී නැත. ඔවුනගේ මොළයට කිසියම් අකාරයක හානියක් වී ඇත්නම් ඒ බව දැන ගන්නට වෛද්‍යවරුන්ට තවත් ටික කලක් ගත වනු ඇත. ඒත් දැනට සිංගප්පූරුව මේ වෛද්‍ය හාස්කමින් උදම් වෙමින් සිටියි.

මෙම සැත්කම ඉතිහාසයේ ඉතාමත් දීර්ඝ එකක් වූ අතර එය සිංගප්පූරුවට ඉමහත් කීර්තියක් අත් කර දීමට සමත් විය.

*මෙම සැත්කමේ හැම පියවරක් ම ඉතා අවදානම් එකක් විය. දෙබිඩි දරුවන්ගේ මොළ ඉතා ප්‍රවේශමෙන් දෙපැත්තට කපා වෙන් කිරීම ඔවුනට බාර වූ මේ බැරෑරුම් කටයුත්තයි. මෙහිදි ධමනි හා නාළිකා කපා වෙන් කරන්නත් ඇතැම් විට ඒවා මුද්‍රා තබන්නටත් සිදු විය.*



වෛද්‍ය කණ්ඩායම මෙහෙය වූ
ශල්‍ය වෛද්‍ය විශේෂඥ යෝ හා වැන්



**මුලින් සැත්කමින් පසු දැඩි සත්කාර ඒකකයට ගෙන ගිය ජමුනා**

පසුගිය වසරේ මැයි මාසයේ නේපාලයේ සල්යාන් ගමේ දී මේ දරුවන්ගේ උපත සිදු වූ වේලේ ඒ දරුවන්ගේ සීයා වූ අරුන් දේව් ෂ්රේස්ත්‍රා කියන්නේ ඔහු සංත්‍රාසයටත් දුකටත් පත් වූ බව ය. දරුවන් බිහි කළ ඔහුගේ දියණිය සන්ධ්‍යා ෂ්රේෂ්ත්‍රා එද පටන් ම නිතර ම අසනීප වූවාය. කත්මණ්ඩු රෝහලේ වෛද්‍යවරු මේ දෙබිඩි දරුවන්ගේ අනාගතය ගැන සැක පහළ කළහ. වෛද්‍යවරුන් සිතුවේ මොළ වැඩෙන්නට පටන් ගත් විට හිස් කබලෙහි ඉඩ නැතිවීම නිසා මේ දරුවන් මිය යතැයි කියා ය.

නේපාලයේ සිටි ඔවුන්ට තිබුණේ එකම එක බලාපොරොත්තුවක් පමණ ය. නේපාල ස්නායු ශල්‍ය වෛද්‍ය කිත් ගෝ හඳුනන ස්නායු ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයෙක් සිංගප්පූරුවේ සිටියේ ය. ඔහු දෙබිඩි දරුවන්ගේ පියා හා කතා බස් කොට දරුවන්ගේ ජීවිත බේරා දීමට අන්තිම උත්සාහයත් ගත්තේ ය. ඒ සැත්කමක් සඳහා සිංගප්පූරුවට දරුවන් ගෙන යන්නට ය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවන්න විදහක් ඔවුනට සිතා ගත නොහැකි විය. සිංගප්පූරු ගුවන් සේවය දෙබිඩි දරුවන් දෙදෙනා හා පවුලේ උදවිය නොමිලයේ සිංගප්පූරුවට ගෙනාවේ ය. පසුගිය ඔක්තෝබරයේ ඔවුන් සිංගප්පූරුවට එන විට ඔවුන් සතු එකම වස්තුව වූයේ ඇඳ සිටි ඇඳුම් පමණ ය.

සිංගප්පූරුවේ දී නගර වැසියෝ ඉතා හොඳ ප්‍රතිචාරයක් දැක්වූහ. ඔවුන්ගේ සැත්කමට මුදල් ගලා ආවේ ය. අන්තිමේදී එකතු වූ අර මුදල ඩොලර් 360000 ක් විය. නේපාලයෙන් ඇවිත් එරට පදිංචිව සිටි ගුර්කා පවුල් ඉඳුම් හිටුම් දී ඔවුන් රැක බලා ගත්හ. 'ගංගාට හා ජමුනාට සිංගප්පූරුවේ කුමාරියන් විදියටයි සැලකුවේ' දරුවන් ගේ සීයා කීවේ ය. රෝහල් අධිකාරීන්ටත් මෙවැනි සැත්කමක් කිරීමට පෙර දෙවරක් සිතන්නට සිදු විය. 'අපට ඉතාමත් ප්‍රවේශමෙන් හිතල බලල මේ ගැන තීරණයක් ගන්න වුණා. අපට මේ වගේ දෙයක් කරන්න තියෙන හැකියාව, තියෙන සම්පත් ගැන හොඳින් විමසන්න සිද්ධ වුණා. මේක අත්හදා බැලීමක්වත්, ප්‍රසිද්ධිය සඳහා කරන දෙයක්වත්, මුදල් ඉපයීම සඳහා කළ දෙයක්වත් නෙවෙයි. සාර්ථක කර ගන්න පුළුවන් කියල හරියට ම දැන ගත්තාට පසුවයි, අපි වැඩේට අත ගැහුවේ" රෝහල් විධායක බාලා ක්‍රිෂ්ණන් කීවේ ය.

"ඒ ළමයි දෙන්නා ම නිරෝගී යි . හරිම දක්ෂයි. හිස් වලින් බද්ධ වී තිබුණත් අනිත් හැම අතින් ම සාමාන්‍ය දරුවන්. හැම තිස්සේ ම හිනාවෙච්ච ගමන් ඉන්නෙ. වෙලාවකට දෙන්න මම අත් අල්ලගෙන ඉන්නවා. වඩාගෙන යානවට හරි ආසයි. නාන්න කැමති යි. හැබැයි ඒක කීප දෙනෙක් එකතු වෙලයි කරන්න වෙන්නෙ. එකට බැඳිල හිටියත් පැහැදිලිව ම ඒ දෙන්නා දෙන්නෙක් කියල පෙනුණා". ප්‍රධාන හෙදිය වූ රග්බීර් කෞර් රික්රාජ් කීවා ය. "සමහර වෙලාවකට එක් කෙනෙක් නිදියනවා. අනික් කෙනා සෙල්ලම් කරනවා. ඇය වැඩි දුරටත් පැවසුවේ වෙනම පුද්ගලයන් දෙදෙනකු සේ වැඩ කරන බව පෙන්වීමට ය.

සැත්කම දෙවතාවක් ම කල් ගියේ ය. ඒ ඔවුන්ට ආසාදනයක් වැළඳීම නිසා ය. තුන්වෙනි වතාවටත් කල් දමන්න වෙතැයි බියක් ද ඇති විය.

# මොළ දෙක වෙන් කළ හැටි

1. වෛද්‍යමය රූප සටහනින් (පහළ) දක්වෙන්නේ මොළ දෙක පිහිටා ඇති ආකාරය යි. ඒ මගින් වෛද්‍යවරුන්ට එය නැති ඇති ඇති ආකාරය තේරුම් ගත හැකි යි. ඒත් මෙය ශල්‍ය වෛද්‍යවරුන්ට මඟ පෙන්වීමට ප්‍රමාණවත් නැහැ. ඒ නිසා වඩා හොඳින් එය තේරුම් ගැනීමට වීදුරුවලින් ශක්තිමත් කළ නයිලෝන් යෙදූ ආකෘතියක් තනනු ලැබුවා, මේ දෙබිඩි දරුවන්ගේ.

2. එය සිදු කළ හැටි .

වෛද්‍යවරුන් මොළයේ පැතිකඩ තලයෙන් තලය ස්කෑන් කළා, චුම්බක තරංග පිළිබිඹු ක්‍රමය යොදා ගෙන. ඊට එක්ස්- කිරණ වැනි ක්‍රමයක් ද භාවිත කෙරුණා. මුලදී මේ රූප ගැටළු සහිත වුනත් සුපරීක්ෂාවීමෙන් ඒවායේ හැඩ, නාලිකා හා ධමනි වෙන් කොට හඳුනා ගන්නට හැකි වුණා.

3. හරස් කඩක් - පැතිකඩ පිළිබිඹු වලින් ගත්තා රූප ප්‍රබල පරිගණකවලට කවා ත්‍රිමාණ චිත්‍රයක් දර්ශක තිරයේ ගොනු කර ගත හැකි වුණා, ඒ රූප යොදා ගෙන අනන්‍ය යථාර්ථ ක්‍රමයෙන් පුහුණුවක් ලැබීමට.

4. වෛද්‍යමය ආකෘති තනන යන්ත්‍රයක් මගින් රැස් කර ගත් දත්ත අනුව මි.මි. 0.1



**මොළ දෙක පිහිටි ආකාරය දැක්වෙන අනුරුවක් හා සටහනක්.**



# විස්මිත සැත්කමට නව මෙවලමක්



සැත්කමට පෙර පුහුණුවක් - පරිගණක ඉංජිනේරුවකු ඩෙක්ට්‍රොස්කෝප් උපකරණය විස්ඩ්එක්සටර් ක්‍රමය යොදා ගෙන ත්‍රිමානව මොළය දකින හැටි පෙන්වයි.

ගංගා හා ජමුනා උපන්නේ 2000 මැයි මාසයේ නේපාලයේ සල්යාත් නම් කුඩා ගම්මානයේ යි. ඔවුන්ගේ හිස මුදුනෙන් එකට බද්ධ වී තිබිණ. හිස් කබල හා මොළය මෙසේ එකට බද්ධව තිබීම උපත් 20 ලක්ෂයකට එකක් වශයෙන් විය හැකි ඉතාමත් විරල එකකි. මීට වසර කීපයකට පෙර නම් එවැනි උපතක් සජීවීව බිහි කරවීමත් කළ නොහැකි එකක්. ඒත් වෛද්‍යවරුනට මෙවැනි කට-යුත්තක් සාර්ථක කර ගැනීමට උපකාර කිරීමට කර ගත හැකි නව මෙවලම් රැසක් ම නිපදවා තියෙ-නවා.

මේ අරුම පුදුම දෙබිඩි දරුවන් වෙනුවෙන් කළ සැත්කමේදී ප්‍රධාන තැනක් ගත්තේ විස්ඩ්එක්සටර් (සෘඪලඤැඥයබඥප) නම් පරිග-ණක වැඩ සටහන යි. සිංගප්පූරුවේ කෙන්ට් රිජ් ඩිජිටල් ලැබ් ආයත-නයේ නිපදවා ඇති මෙමම වැඩ සට-හන ප්‍රථම වතාවට භාවිතයට ගත්තේ 1997 දී ය. මේ මගින් දෙබිඩි දරුවන්ගේ මොළය බද්ධ වී ඇති ආකාරය ගැන සැත්කමට පෙර වෛද්‍යවරුනට පැහැදිලි චිත්‍රයක් ලබා ගත හැකි වුණා. ස්නායු ශල්‍ය වෛද්‍යවරුනට පරිගණකය තුළින් අතත්‍ය යථාර්ථ (සෘඪපබහවත පඥවතඪබර) ක්‍රමයට බලමින් පියවරෙන් පියවරට සැත්කම සැලසුම් කළ හැකි වුණා.

මෙහිදී වෛද්‍යවරුන් විශේෂ උපැස් යුවලක් පැළඳ සිටි අතර ඒ අනුව ඔවුනට ඩෙක්ට්‍රොස්කොප් යන්ත්‍රයට එබී බලමින් ඒ ලෝකයට පිවිස අහසේ පා වෙන්නාක් සේ පෙනුණු මොළයන්ගේ පිළිබිඹු ඇඟිලිවලින් ස්පර්ශ කරමින් ඒවා එකිනෙක බද්ධ වූ තැන් හා ආකාරයත් හොඳින් තේරුම් ගැනීමට ඔවුනට හැකි වුණා. මේ උපකරණය භාවිත කරගෙන වෛද්‍යවරුන් 5 දෙනකුට එකවර පෙරහුරුවල යෙදෙන්නට හැකි වුණා. මේ අභ්‍යාසය ඇත්තට ම සැත්කමක යෙදෙන විට කරන දෙයට බොහෝ සේ සමාන යි. සිංගප්පූරු කණ්ඩායම මේ සංඛ්‍යාංක දත්ත හා තොරතුරු ඇමරිකා එක්සත් ජනපදයේ බැල්ටිමෝර් නගරයේ ජෝන් හොප්කින්ස් ආයතනයේ විශේෂඥ වෛද්‍ය බෙන්ජමින් කාසන් වෙත යැවූ අතර ඔහුගෙන් ඒ පිළිබඳව උපදෙස් ද මොවුනට ලැබුණා. මේ නව උපකරණය යොදාගෙන ප්‍රථම වරට 1997 දී මේ සිංගප්පූරු තාක්ෂණයෙන් ජර්මන් දෙබිඩි දරුවන් වෙන් කිරීමට සැත්කමක් කිරීමේ ගෞරවය හිමි වන්නේ වෛද්‍ය කාසන්ට යි. 'මේ ක්‍රමයෙන් ලබා ගත හැකි ත්‍රිමාණ රූපවලින් විශාල වාසියක් වෙනවා, ශල්‍ය වෛද්‍යවරුන්ට ' යැයි කියන වෛද්‍ය කාසන් 'මේ විදියේ පහසුකමක් නොතිබුණා නම් ගංගා හා ජමුනා දෙබිඩි දරුවන් සැත්කමකට භාජනය කළ ස්නායු ශල්‍ය වෛද්‍යවරයා කිසිදු නොගිය රටක, නොදන්නා බසක් කතා කරන, මාර්ග සංඥා නොතේරෙන, ජනාකීර්ණ නගරයකට ගිය ටැක්සි රියැදුරකුගේ තත්ත්වයට පත්වෙනවා' වැඩි දුරටත් කියනවා. සිංගප්පූරු මහරෝහලේ ශල්‍යාගාරයේදී ගංගා ජමුනා දැරියන්ට විසි එක්වන සියවසේ තාක්ෂණයේ නවත් විස්මිත නිපැයුම් රැසක උදව් ලැබුණා. ඔවුනගේ මොළවල ඇතැම් කොටස් උත්තේජනය කරන්නට මයික්‍රොඉලෙක්ට්‍රෝඩ භාවිත කෙරුණා. රුධිරය ගලා යාම විමර්ශනය කළේ අධි ශබ්ද තරංග යොද ගත් උපකරණ මගින්. ඉතා සංකීර්ණ ස්නායු අවේක්ෂණ පද්ධතියක් භාවිත කරනු ලැබුවා. ඩැහි අඬු, බැලූන කැතිටර, ක්ලිප් වර්ග හා කතුරු මේ කාර්යය සඳහා ඉතාමත් කුඩා ප්‍රමාණයෙන් විෂ්කම්භය මි.මි. 1 කටත් අඩුවෙන ආකාරයට තැනුණනා. හිස් කබල ආවරණය කරන්නට ගෝර්-ටෙක්ස් නම් විශේෂ රෙදි වර්ගයක් යොද ගත්තා.

මේවා යොදගෙන පරිගණක තිරය හා සුවිශේෂ උපැස් යුවලක් දමාගෙන මාස කීපයක් තිස්සේ අතත්‍ය යථාර්ථ ක්‍රමයෙන් පුහුණු වීමෙන් පසුවයි, ඇත්තටම සැත්කමට අත ගැසුවේ.

මෙවැනි සැත්කමක දී දිවි ගලවා ගැනීමට ඉඩ ප්‍රස්ථාව ඇත්තේ 80% ක් බව දෙමාපියන්ට දන්වනු ලැබී ය. එහෙත් ඕස්ට්‍රේලියානු විශේෂඥයකුගේ මතය වූයේ එය 33% ක් බව ය. ඒ නිසා අප්‍රේල් 6 දා දරුවන් ශල්‍යාගාරයට ගෙන යන විට හැම දෙනාම සංත්‍රාසයෙන් පසු වූහ.

"අපට පැහැදිලිව පෙනුනා මේ වෙන් කිරීම දීර්ඝ කාලයක් තිස්සේ කළ යුතු දෙයක් බව". ස්නායු ශල්‍ය වෛද්‍ය අංශයේ වෛද්‍ය විශේෂඥ චැන් කීවේ ය. ගංගා ජමුනා දෙදෙනාගේ හිස් තුළ මොළ දෙක ටාම් සංකේතයේ මෙන් එකිනෙක තුළට වැද්දී තිබුණි. මොළ දෙක වෙන් කළ වෙනම පටලයක් තිබුණේ නැත. ඒවා වෙන් කිරීමේ දී පටකවලට තුවාල වීම නොවැළැක්විය හැකි විය.

වෛද්‍ය වින්සන්ට් යෝ ප්‍රමුඛ ප්ලාස්ටික් ශල්‍ය විශේෂඥයෝ සැත්කමට මූලික කටයුතු සූදනම් කළහ. ඔවුහු දරුවන්ගේ හිස් මුදුන් තුළට සේලයින් එන්නත් කළ හ. ඒ චැන් හා යෝ යන ශල්‍ය වෛද්‍යවරුන්ට වැඩි ඉඩක් ලැබෙන පරිදි ය.

"ඒක හරියට බැලූමක් පුම්බනවා වගෙයි" ඔහු පැහැදිලි කළේ ය. යෝ බද්ධ වී තිබූ හිස් කබල වෙන් කොට සම දික් අතට පලා ස්තර දෙකක් සකස් කළේ පසුව වසා දැමීමේ දී වෙන වෙන ම සම අවශ්‍ය බැවිනි.

ඉන්පසු ශල්‍ය වෛද්‍යවරු ඩෙක්ට්‍රොස්කෝපය භාවිත කරමින් ( ඒ පිළිබඳ තතු වෙන ම පළ වේ.) මොළයේ රුධිර වාහිනීන් එකින් එක වෙන් කරන්නට වූහ. ත්‍රිමාණ රූප දර්ශකයක් වන මෙම නව මෙවලම මගින් කළ ඒ සියුම් කටයුත්තේ දී පැය ගණන් නොව දින ගණන් ගත විය.

අන්තිමට දෙබිඩි දරුවන් දෙදෙනා වෙන් කරනු ලැබුවේ අප්‍රේල් 10 වැනිද පාන්දර 1.42 ට ය. මුලින් ම ජමුනා දැඩි සත්කාර ඒකකය වෙත යවනු ලැබී ය. ගංගා යවනු ලැබුවේ ඉන් පැය 6කට පසුව ය.

ඇගේ හිසේ තවත් සෙ.මී.3ක සිදුරක් මැසීම සඳහා අතිරේක සැත්කමක් කිරීමට සිදු විය.

ගංගා හා ජමුනාට තවත් මාස කීපයක් රෝහලේ ගත කිරීමට සිදු වෙයි.

මේ විස්මිත සැත්කමින් පසු සිංගප්පූරුවේ වෛද්‍යවරුන්ට ද ලෝකයේ විශිෂ්ටතම ශල්‍ය වෛද්‍යවරුන්ගේ තත්ත්වයට පත්වීමට හැකි විය. මැයි මාසයේ දී තවත් සැත්කමක් කිරීමට හවුල් වීමට ඔවුනට අවස්ථාව උදා විය. ඒ ඕස්ට්‍රේලියාවේ උපත ලැබීමට නියමිතව තිබූ දෙබිඩි දරුවන් දෙදෙනකු වෙන් කිරීමේ සැත්කමකට යි. ❑

**ආසිරි**

ඒෂියා වීක් ඇසුරෙනි